# බෝධි වන්දනා ගාථා පිළිබඳ විමර්ශනයක්

ආධුනික කථිකාචාර්ය වැලිවිට සොරත හිමි.

මෙලොව ජීවත් වන සෑම පුද්ගලයෙක් විසින් ම සිදුකළ යුතු දෙයක් හැටියට වන්දනාව පෙන්වා දිය හැකිය. වන්දනාව සිදු කරනු ලබන්නේ වයසින් හා ගුණයෙන් වැඩි පුද්ගලයෙකුටය. එසේ සිදු කරන්නේ තමාගේ ආදරය, ගෞරවය, යටත් බව, අවනත බව හුවා දැක්වීම සඳහාය. එය සිත කය වචනය යන ස්ථාන තුනෙන් ම සිදු කළ හැකිය. මෙය චාරිත්‍රයක් වශයෙන් සිදු කරන නිසා ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා අතරින් ශීලයට අයත් වන්නකි. දශ පුණ්‍යක්‍රියාවලින් අපචායන (පිදිය යුත්තන් පිදීම) නම් කුශලයට අයත් වේ. වන්දනාව යම් පුද්ගලයෙකුට දක්වන විට එයින් වැඳුම් ලබන්නාට කිසිදු සෙතක් අත් නොවේ. ඔහුගේ තිබෙන වයස හෝ ගුණ යහපත් බව නිසා කෙනෙක් වැඳුම් පිදුම් සිදුකරති. වයසින් වැඩි යැයි සිතා අහංකාර පුද්ගලයෙකුට කෙනෙක් පුදන්නේ නම් ඔහුගේ අහංකාරය ප්‍රීතියක් බවට පත් වේ. එහෙත් නිරහංකාර පුද්ගලයෙකුට කරන වන්දනා තුළින් එබන්දක් දැකිය නොහැක. ඇතැම්හු කෙනෙකුට වඳින්නේ නොයෙක් අදහස් හිතේ තබාගෙනය. රජ කෙනෙකුට වඳින්නේ ඔහුගෙන් කරදරයක් වේ යැයි සිතාය. දුගියෙක් කෙනෙකුට වඳින්නේ කරුණාව ලබා ගැනීම සඳහාය. මෙවැනි වන්දනා සිදු කරනු ලබන්නේ යම්කිසි රැවටීමක් හිතේ තබාගෙන නිසා එවැනි වැඳුම් අකුශල පක්‍ෂයට විනා කුශල පක්‍ෂයට අයත් නොවේ. කුශල පක්‍ෂයට අයත් වන්නේ ගුණ සලකා උත්තම පුද්ගලයන්ට කරන වන්දනාවන්ය.

බෝධි පූජාව ද එක් වන්දනා ක්‍රමයකි. එය බුද්ධකාලයේ සිට ම බෞද්ධයා විසින් සිදු කරගෙන එනු ලබන ආගමික චාරිත්‍රයකි. එය වර්තමානය වන විට සුලභ දසුනක් වී ඇත. ලංකාවේ සෑම විහාරස්ථානයක ම බෝධියක් දක්නට ලැබේ. ලෙඩ දුක්වලින් නිදහස් වීමට, ග්‍රහ අපල දුරු වීමට, විභාග සමත් වීමට, රැකියා ලැබීමට, සතුරු බියෙන් මිදීමට, ජීවිතය ජය ලැබීමට, වෙළඳ ව්‍යාපාර දියුණුවට අද බොහෝ දෙනා බෝධි පූජා පවත්වති. මෙවැනි පූජා පවත්වනු ලබන්නේ ඇතැම්විට තනි තනිව හෝ සමූහ වශයෙනි. බුදුදහම පෙන්වා දෙන අන්දමට ත්‍රිවිධ චෛත්‍ය අතරින් බෝධිය පාරිභෝගික වස්තුවකි. එමනිසා යම් බෝධියක අත්තක් මියගිය විට එය කැපීමටත්, ආදාහනය කිරීමටත් චාරිත්‍ර විධි තිබේ. එමනිසා ම බෝධි පූජාවක් පැවැත්වීමේදී ද සම්මත වූ සම්ප්‍රදායානුකූල චාරිත්‍ර විධි රාශියක් තිබේ. එහෙත් වර්තමානයේ ඇතැම් විට බෝධි පූජා පැවැත්වීම මෝස්තරයක් වී තිබීම කණගාටුවට කරුණකි.

බෝධි පූජාවක් පවත්වන අවස්ථාවේ බෝධියට පූජා කිරීම සඳහා කියනු ලබන වන්දනා ගාථා බොහෝය. එහෙත් ඒ සියළු ගාථාවක් ම සෑම බෝධි පූජාවක ම ගායනා කරන්නේ නැත. ඒ අනුව බෝධි පූජාවක් පැවැත්වීමේදී පහත සඳහන් ගාථා කියා පූජාව පැවැත්වීම සුදුසු වන්නේය. එම ගාථා ගායනා කිරීමේදී ඒවායේ තේරුම ද දැනගෙන වන්දනා කළ යුතුය. මෙවැනි ගාථා කියමින් වන්දනා කිරීම රෝග, ග්‍රහ අපල හා වෙනත් උවදුරුවලින් දුරුවීමට ද දියුණු වීමට ද යස ඉසුරු ලැබීමට ද හේතුවක් වන්නේය.

බෝධි වන්දනාව ප්‍රථම වරට සිදු කළේ බුදුන් වහන්සේ විසිනි. බුද්ධත්වයෙන් දෙවන සතියේ බෝමැඩ පිහිටි වජ්‍රාසනයෙන් නැගී සිට තමන්ට බුදුවීමට පිහිට වූ ඇසතු බෝ රුකට ඇසිපිය නොහෙළා බලා සිට සිය කෘතඥතාව දැක්වූ සේක.[1] එය නේත්‍ර පූජාවකි. මෙය අනිමිස ලෝචන පූජාව යනුවෙන් ද හඳුන්වනු ලැබේ. ඉන්පසු බෝධියට වැඳීම් පිදීම් සිදුකළ බව සඳහන් වන්නේ

ආනන්ද හිමියන් විසින් ජේතවන දොරටු සමීපයේ රෝපණය කරන ලද ''ආනන්ද බෝධියටය.''[2] එය රෝපණය කරන ලද්දේ ද බුදුරජුන් ජේතවන විහාරයේ වැඩ නොසිටි අවස්ථාවක පැමිණෙන්නා වූ පිරිස් වෙත වැඳීම් පිදීම් සිදු කිරීම සඳහාය.

තථාගත පරිනිර්වාණයෙන් පසු වර්ෂ 236 ක් ඉක්ම ගිය තැනේදී සංඝමිත්තා තෙරණිය විසින් ජම්බුද්වීපයේ පිහිටි බෝධීන් වහන්සේගේ දක්‍ෂිණ ශාඛාව ලක්දිවට වැඩමවන ලදි. එකල ලක්දිව රාජ්‍යය ගෙනගිය දේවානම්පියතිස්ස රජුට එය පිළිගැන්වීමෙන් පසුව එතුමා විසින් මහමෙවුනා උයනේ රෝපණය කරන ලදි.[3] ඒ අනුව ලක්දිවට වැඩම වූ බෝධීන් වහන්සේ උදෙසා මුල් ම බෝධි වන්දනාව සිදු කරන ලද්දේ ද එතුමන් විසිනි.[4] එය අතීතයේ පටන් වර්තමානය දක්වා ම සිදු කරගෙන එනු ලබයි. ඒ අනුව බෝධියට වන්දනා කිරීම ඇඳිලි බැඳගෙන පමණක් සිදු නොකොට ගාථාවක් සජ්ඣායනා කරමින් වන්දනාව සිදු කළ බව බෝධි වංශයේ සඳහන් වේ.[5] එය ඉන්දියාවේ පිහිටි ශ්‍රී මහා බෝධීන් වහන්සේ ද වන්දනා කිරීම සඳහා රචිත ගාථාවකි.[6] එම ගාථාව වන්නේ

යස්සමූලේ නිසින්නෝව - සබ්බාරි විජයං අකා

පත්තෝ සබ්බඤ්ඤුතං සත්‍ථා - වන්දේ තං බෝධි පාදපං

ශාස්තෲ වූ බුදුරජාණන් වහන්සේ යම් මුලක වැඩ සිට සියලු සතුරන් දිනීම කළ සේක් ද, සර්වඥ බවට පැමිණි සේක් ද ඒ බෝධි වෘක්‍ෂය වඳිමි.

පසුකාලීනව මීට තවත් ගාථාවක් එකතු වී ඇත. එය වර්තමානය දක්වා ම භාවිත වෙමින් පවති. එම ගාථා පාඨය මෙසේය.

ඉමේ එතේ මහා බෝධි - ලෝක නාථෙන පූජිතා

අහම්පි තෙ නමස්සාමි - බෝධි රාජා නමත්ථු තෙ

ඒ මේ මහා බෝධිය ලෝක නාථයන් වහන්සේ විසින් පුදන ලදි. මම ද එය වඳිමි. බෝධි රාජයන් වහන්ස ඔබට නමස්කාර වේවා.

ලක්දිවට වැඩම වූ අනුරාධපුර මහමෙවුනා උයනේ ඇති බෝධීන් වහන්සේ වන්දනා කිරීම සඳහා මුල් කාලයේ භාවිත කළ ගාථාව එසේ වුවත් වර්තමානයේ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ වන්දනා කිරීම සඳහා ගාථා කිහිපයක් ඇත. ඒවා මෙසේය.

සුපතිට්ඨිත රට්ඨනුරාධපුරෙ - සමදිට්ඨිත දක්ඛිණ සාඛ භවං

සුභ මේඝවනම්බර මේඝනිභං - ජය බෝධිමහං පණමාමි වරං

අනුරාධපුර රටෙහි මනාව පිහිටියා වූ, මනා දැකීම් ඇති දකුණු ශාඛාවෙන් හටගත්, යහපත් වූ මේඝ වනය නැමති ආකාශයෙහි වළාකුලක් බඳු වූ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ මම වඳිමි.

ඉමස්ස සාඛං සයමෙව ඡෙත්වා - ලංකාතලේ ලෝක හිතාය හෝතු

මහාමුනින්දෙන අධිට්ඨිතං යං - නමාමහං බෝධිනිරුත්තරං තං

මෙහි ශාඛාවක් තමන් විසින් ම සිඳී ලෝකයාගේ හිත පිණිස ලක් තලයෙහි වේවා යි මහා මුනීන්ද්‍රයන් විසින් යම් අධිෂ්ඨානයක් කරන ලද ද ඒ උතුම් වූ බෝධීන් වහන්සේ වන්දනා කරමි

සමෝසරිත්වා උභතො නරාධිපා - ගලප්පමාණෙ උදකෙ මහණ්ණවෙ

අකංසු යෙ රාජවරා සදාදරා - නමාමි තං බෝධිනිරුත්තරං තං

රජවරු දෙදෙනා එකතු වී ගෙල දක්වා ජලය ඇති මහ මුහුදෙහි බැස ආදර ගෞරව කළාහු ද ඒ උතුම් වූ බෝධීන් වහන්සේ වන්දනා කරමි

යස්සානුභාවෙන සුසන්තමෙතං - නාගා සමාගම්ම අකංසු සාදරං

සුදුග්ගමෙ අබ්භුතමාවහන්තං - නමාමි තං බෝධිනිරුත්තරං තං

යමෙකුගේ ආනුභාවයෙන් මනාව දැමුණා වූ නාගයෝ එක් රැස් වී ආදර ගෞරව කළාහු ද, අපහසු ගමන් ඇති අද්භූත බව ගෙන දෙන්නා වූ ඒ උතුම් බෝධීන් වහන්සේ වන්දනා කරමි.

පතිට්ඨිතං පඤ්ච ඵලං හිතාවහං - මහාමහින්දස්ස කරෙ පදස්සිනං

සුරාසුරබ්‍රහ්මගණාභිවන්දිතං - නමාමි තං බෝධිනිරුත්තරං තං

ප්‍රදක්ෂිණා කළ මහා මහින්ද තෙරුන්ගේ හස්තයෙහි පිහිටි හිතගෙන දෙන ඵල පහක් හටගත්තා වූ සුර අසුර බ්‍රහ්ම සමූහයා විසින් වඳින ලද ඒ උතුම් බෝධීන් වහන්සේ වන්දනා කරමි.

එහෙත් මෙම ගාථා අතරින් බෝධි පූජාවක් පවත්වන විට අද භාවිත කරනුයේ මුලින් කී ගාථාව පමණි. සෙසු ගාථා සජ්ඣායනා කිරීමක් සිදුවන්නේ නැත. බෝධි පූජාව පවත්වන අවස්ථාවේ සියලු ග්‍රහ අපල දුරු වී නිරෝගි සම්පත්තිය ලැබේවා යි යන ප්‍රාරථනාවෙන් යුක්තව කියනු ලබන පැරණි ගාථා කිහිපයක් මෙසේය.[7]

යස්ස මූලෙ මහා සත්තෝ - ජෙත්වා මාරං මහබ්බලං

පත්තෝ සබ්බඤ්ඤුතං සෙට්ඨං - වන්දේ තං බෝධිමුත්තමං

යම් බෝධි මූලයක දී මහා බෝධි සත්වයන් වහන්සේ මහත් බල ඇති මාරයා පරදවා සියල්ල දත් බුදු බවට පැමිණි සේක් ද ඒ උත්තම බෝධීන් වහන්සේට වඳිමි.

යස්ස මූලේ නිසීදිත්වා - සත්තාහං ලෝකනායකෝ

විමුක්තිසුඛ සංවෙදී - වන්දේ තං බෝධිමුත්තමං

ලෝකනායක වූ තථාගතයන් වහන්සේ යම් බෝධියක මුල වැඩ සිට සතියක් මුළුල්ලේ විමුක්ති සුවය වින්දේ ද ඒ උත්තම බෝධීන් වහන්සේට වඳිමි.

යස්ස පූජේසි සම්බුද්ධෝ - සත්තාහං සක ලෝචනෙ

පූජිතං නර දේවේහි - වන්දේ තං බොධිමුත්තමං

බුදුරජාණන් වහන්සේ සත්යක් මුළුල්ලේ යම් බෝ රුකකට තමන් වහන්සේගේ නේත්‍රයන් පූජා කළ සේක් ද ඒ උත්තම බෝධීන් වහන්සේට වඳිමි.

ආයුං ආරෝගතං වණ්ණං - යසං කිත්තිං ධනං බලං

වඩ්ඪෙන්තං පූජයන්තානං - වන්දෙ තං බෝධිමුත්තමං

බෝධියට පුදන්නවුන්ට ආයුෂය, නිරෝගි බව, ශරීර වර්ණය, යශස, කීර්තිය, ධනය, බලය යන මේවා වර්ධනය කරන්නා වූ උත්තම බෝධීන් වහන්සේට වඳිමි.

දුක්ඛං රෝගං භයං වෙරං - සෝකං ජානිං උපද්දවං

හරන්තං පූජයන්තානං - වන්දේ තං බෝධිමුත්තමං

පූජා කරන්නන්හට දුක, රෝගය, බිය, වෛරය, ශෝකය, ධනහානිය, උපද්‍රවය යන මේවා දුරු කරන්නා වූ උත්තම බෝධීන් වහන්සේට වඳිමි.

පුඤ්ඤකාමීහි විඤ්ඤූහි - නරදෙවෙහි සාදරං

වන්දිතං පූජිතං සෙට්ඨං - වන්දේ තං බෝධිමුත්තමං

පින් කැමති නුවණැති දෙවි මිනිසුන් විසින් වඳින්නා වූ පුදන්නා වූ උත්තම බෝධීන් වහන්සේට වඳිමි.

සබ්බකාම දදෝ බෝධී - සබ්බදුක්ඛ විනාසකෝ

වන්දතෝ දේතු මෙ සන්තිං - බෝධි රාජා නමත්ථු තෙ

සියලු කැමති දෑ දෙන්නා වූ සියලු දුක් නසන්නා වූ බෝධීන් වහන්සේ වඳින්නා වූ මා හට ශාන්තිය ගෙන දේවා. බෝධිරාජයන් වහන්ස ඔබ වහන්සේට නමස්කාර වේවා.

මෙම ගාථා වර්තමානයේ සෑම බෝධි පූජාවක ම වන්දනා කිරීම දක්නට නොලැබුණත් ඇතැම් අවස්ථාවලදී භාවිත කරන අයුරු දැකිය හැකිය. බෝධි පූජාවක දැකිය හැකි තවත් සුවිශේෂී ගාථාවක් පහත දැක්වේ.

ඉන්දනීල වණ්ණපත්ත සෙත ඛන්ධ භාසුරං
සත්පු නෙත්ත පංකජාහි පූජිතග්ග සාතදං
අග්ගබෝධි නාම වාම දෙවරුක්ඛ සන්නිභං
තං විසාල බෝධි පාදපං නමාමි සබ්බදා

ඉන්ද්‍රනීල මාණික්‍ය වර්ණ වූ පත්‍ර ඇති ස්වේත වර්ණ (සුදු පාට) කඳකින් බබලන්නා වූ බුදුරජාණන් වහන්සේගේ නේත්‍ර නැමැති පියුම්වලින් පූජා කරනු ලැබුවා වූ උතුම් නිවන් සැප ගෙන දෙන දිව්‍ය වෘක්ෂයකට හා සමාන වූ අග්‍ර බෝධි නම් වූ උත්තම වෘක්ෂ රාජයා මම සැමදා වඳිමි.

ඉහතින් සඳහන් කරන ලද සියලු ගාථා ගෞතම මුනීන්ද්‍රයන් වහන්සේගේ ඇසතු බෝධිය වන්දනා කිරීම සඳහා යොදා ගන්නා වූ ගාථාවන්ය. සෑම බෝධි සත්වයෙක් ම බුද්ධත්වය අවබෝධ කරගන්නා ලද්දේ ගසක් මුල වැඩ සිටිමින්ය. සම්මා සම්බුද්ධත්වයට පත් වූ බුදුවරුන් විසිඅට දෙනෙක් පිළිබඳ ව තොරතුරු හමුවේ.[8] ඒ අනුව ඒ ඒ බුදුවරුන්ට ආවේණික වූ බෝධි වෘක්ෂයක් ද ඇත.

දීපංකර බුදුරජුන් බුදුවූයේ පුලිල ගසක් මුලය. කොණ්ඩඤ්ඤ බුදුරජුන් බුදුවූයේ ශාල කල්‍යාණි නම් ගසක් මුලය. මංගල, සුමන, රේවත, සෝභිත යන බුදුවරුන් බුදු වූයේ නා ගසක් මුලය. අනෝමදස්සි, පියදස්සසි යන බුදුවරුන් බුදු වූයේ කුඹුක් ගසක් මුලය. පදුම, නාරද යනබුදුවරුන් බුදුවූයේ මහාසෝණ නම් ගස මුලය. පදුමුත්තර, වෙස්සභූ යන බුදුවරුන් බුදු වූයේ සල් ගසක් මුලය. සුමේධ බුදුරජුන් බුදු වූයේ බක් මී ගසක් මුලය. සුජාත බුදුරජුන් බුදු වූයේ හුණ ගසක් මුලය. අත්ථදස්සී බුදුරජුන් බුදු වූයේ සපු ගසක් මුලය. ධම්මදස්සී බුදුරජුන් බුදු වූයේ රත්කරව් ගසක් මුලය. සිද්ධත්ථ බුදුරජුන් බුදු වූයේ කිණිහිරිය ගසක් මුලය. ඵුස්ස බුදුරජුන් බුදු වූයේ නෙල්ලි ගසක් මුලය. විපස්සි බුදුරජුන් බුදු වූයේ පළොල් ගසක් මුලය. සිඛී බුදුරජුන් බුදු වූයේ ඇටඹ ගසක් මුලය. කකුසඳ බුදුරජුන් බුදු වූයේ මහරි ගසක් මුලය. කෝනාගමන බුදුරජුන් බුදු වූයේ දිවුල් ගසක් මුලය. කස්සප බුදුරජුන් බුදු වූයේ නුග ගසක් මුලය.[9]

මේ අනුව සෑම බුදුවරයෙක්ටම බෝධි වෘක්ෂයක් ඇති නිසා ඒ ඒ බෝධි වෘක්ෂය වන්දනා කිරීම සඳහා අට විසි බෝධි වන්දනා ගාථා නමින් ගාථා විශේෂයකුත් දක්නට ලැබේ.[10]

තණ්හංමේධංකරානං හි - සත්තපණ්ණී ච කිංසුකො
සරණංදීපංකරානං හි - පිප්ඵලී පිප්ඵලී දුවේ

කොණ්ඩඤ්ඤස්ස සාලකල්‍යාණං - නාගරුක්ඛො ච මංගලෙ
සුමනස්ස නාගරුක්ඛො ච - තථා රෙවත සත්පුනො

සොභිතස්ස ච නාගරුක්ඛො - අජ්ජුනොනොමදස්සිනො
පදුමස්ස මහාසොනො - තථා නාරද සත්ථුනො

පදුමුත්තරස්ස සලාලො - සුමේධස්ස හි නිම්බකො
සුජාතස්ස මහාවේළු - කකුධො පියදස්සිනො

චම්පකො අත්ථදස්සිස්ස - බිම්බජාලො ධම්මදස්සිනො
සිද්ධත්ථස්ස කණිකාරො - තිස්සස්ස අසනො අහු

ඵුස්සස්සාමලකො බෝධි - විපස්සිස්ස ච පාටලී
සිඛිස්ස පුණ්ඩරීකො ච - වෙස්සභුස්සපි සාලකො

සිරීසො කකුසන්ධස්ස - කොනාගමනස්සුදුම්බරො
නිග්‍රොධො කස්සපබුද්ධස්ස - අස්සත්ථො ගෝතමස්ස හි

ඉමෙ එතේ මහා බෝධි - ලොකනාථෙහි පූජිතා
අහංපි තෙ නමස්සාමි - බෝධි රාජා නමත්ථු වො

මේ සෑම ගාථාවකින් ම කියවෙන්නේ ඒ ඒ බුදුවරයන් වහන්සේලාගේ නම් හා බෝධිය වූ වෘක්ෂය පිළිබඳ ව තොරතුරුය. අවසන් ගාථාවෙන් සියලු බෝධි වෘක්ෂයන්ට නමස්කාර වේවායි කියනු ලැබේ.

ඉහතින් සඳහන් කරන්නට යෙදුන සෑම ගාථාවක් ම වර්තමානයේ සිදු කරනු ලබන බෝධි පූජාවක දක්නට ලැබෙන්නේ අල්ප වශයෙනි. ඊට හේතු වී ඇත්තේ වර්තමාන බෝධි පූජාවක සුවිශේෂී ලක්‍ෂණයක් වී ඇත්තේ බෝධි වන්දනා කවි තාලයකට අනුව කීමය. එහි වරදක් නැත. එහෙත්බ පාලි භාෂාවෙන් කියන්නා වූ ගාථා තේරුම් දැනගෙන කීම තුළින් කියන්නා තුළ ශ්‍රද්ධාව වැඩි වීමට හේතුවක් වෙයි. එසේම එහි බලයක් ද ඇත. උදාහරණ ලෙස පිරිත් කීම දැක්විය හැකිය. පිරිත් සූත්‍ර සෑම එකක් ම පාලි භාෂාවෙන් යුක්තය. නිවෙස් තුළ පිරිතක් කියන විට එම සූත්‍ර සජ්ඣායනා කරනු ලබයි. අසන්නා එහි තේරුම නොදැන වුවත් ශ්‍රවණය කරයි. ඒ යම් විශ්වාසයක් ගොඩ නගාගෙනය. එසේනම් බෝධි වන්දනා ගාථා කීම තුළින් ද අර්ථය නොවැටහුණත් එයින් යම් විශ්වාසයක් ඇති කරගත හැකිය. අර්ථය දැනගත් පසු අප වන්දනා කරන ගාථාවෙන් කියවෙන්නේ මෙනම් අදහස යැයි දැනගත හැකි වන්නේය.

---

[1] ජාතකට්ඨකථා, නිදානවණ්ණනා, හේ. වි. මු. 1926, පි. 74

[2] පාලි මහාබෝධිවංසො, (සංස්.) වැගම පියරතන හිමි, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන, 1996, පි. 52.

[3] පතිට්ඨාපෙතුං පාදාසි - බෝධිං රඤ්ඤො'හයස්ස තං
මහාතිත්ථම්හි උය්‍යානෙ - පතිට්ඨාපෙසි භූපති
මහාවංසො, පඤ්චදසම පරිච්ඡේදො, (සංස්.) පොල්වත්තේ බුද්ධදත්ත හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1959, ගා. 83. පි. 80.

[4] සයං දොවාරකථානෙ - ඨත්වාන දිවසෙ තයො
තත්ථෙව පූජං කාරෙසි - විවිධං මනුජාධිපො
මහාවංසො, එකූනවීසති පරිච්ඡේදො, (සංස්.) පොල්වත්තේ බුද්ධදත්ත හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1959, ගා. 31. පි. 103.

[5] පාලි මහාබෝධිවංසො, (සංස්.) වැගම පියරතන හිමි, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන, 1996, පි. 1.

[6] චන්ද්‍රවිමල හිමි, රේරුකානේ, බෝධි පූජාව, සිකුරු ප්‍රකාශකයෝ, පොල්ගස්ඕවිට, 2002, පි. 24.
[7] චන්ද්‍රවිමල හිමි, රේරුකානේ, බෝධි පූජාව, සිකුරු ප්‍රකාශකයෝ, පොල්ගස්ඕවිට, 2002, පි. 28, 29.
[8] බුද්ධවංසපාළි, බුද්ධපකිණ්ණකකණ්ඩං,
[9] චන්ද්‍රවිමල හිමි, රේරුකානේ, බෝධි පූජාව, සිකුරු ප්‍රකාශකයෝ, පොල්ගස්ඕවිට, 2002, පි. 18, 19.
[10] සුමන හිමි, දියපත්තුගම, පැරණි බෞද්ධ වන්දනා ගාථා හා පූජා ගාථා එකතුව, මොඩන් පොත් සමාගම, 1999, පි. 37, 38